Uva Wellassa University

නව ලොවින් දිනුම ලබන්න නව ලොවට සේවය කරන්න

# ප්‍රසම්පාදන දැන්වීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් විශ්වවිද්‍යාලය සඳහා පහත සේවාව සැපයීමට සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍රයට අනුව මිල ගණන් කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | ටෙන්ඩර් අංකය |
|---|---|---|
| 01 | ප්‍රධාන ආපන ශාලා සේවය පවත්වාගෙන යාම 2018 | යූඩබ්යූ/පීඒ/සීඑස්/18/01 |

ඉල්ලුම්කරුවන් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුල ටෙන්ඩර්පත්‍ර මිලදී ගැනීම සඳහා ලිඛිත අයදුම්පත සමඟ එක් ටෙන්ඩර්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.2,000.00 ක මුදලක් ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබා ගත් රිසිට්පත හෝ විශ්ව විද්‍යාලයේ ගිණුම් අංක 3114820ට ලැබෙන සේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) වෙත ඉදිරිපත් කිරීමෙන් 2018.02.26 දින සිට 2018.03.19 දින දක්වා අවශ්‍ය ටෙන්ඩර්පත්‍ර ලබා ගත හැකිය. ටෙන්ඩර්පත් http://www.uwu.ac.lk/procurement/ යන විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මහින්ද ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මහින් ටෙන්ඩර්පත් ලබාගන්නා ඉල්ලුම්කරුවන් , "ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය" නමින් නිකුත් කල රු.2,000.00 ක් වටිනා බැංකු ඇපකරයක් සමඟ හෝ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 3114820 ට ලැබෙන සේ මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත ටෙන්ඩර්පත් සමඟ අමුණා එවිය යුතුය. ටෙන්ඩර්පත් මිලදී ගැනීමට පෙර ඉල්ලුම්කරුවන් හට නොමිලයේ ටෙන්ඩර්පත් පරික්ෂා කල හැකිය.

මිල ගණන් ඉදිරිපත් කිරීම 2018.03.20 වෙනි දින ප.ව.2.30ට හෝ ඊට පෙර සිදු කල යුතු අතර මිල ගණන් 2018.03.20 දින ප.ව.2.30 පසු වූ වහාම විවෘත කරනු ලැබේ. විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට (බලයලත් ලිපියක් සමඟ) සහභාගි විය හැක. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ ටෙන්ඩර් අංකය සඳහන් කළ යුතු අතර මිල ගණන් ඉදිරිපත් කිරීම ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් මෙම ලිපිනයට ගෙනවිත් ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

වැඩි විස්තර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) 055-2226470 දුරකථන අංකයෙන් ලබා ගත හැකිය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බදුල්ල
2018.02.25